## පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ කළමනාකරණ සහකාර අධි පන්තිය සේවා ගණය සඳහා වන උසස් කිරීමේ පරිපාටිය

01. සම්බන්ධ වන ආයතන

1.1 දෙපාර්තමේන්තුව : පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව

යොමු අංකය : PCC/01/02/13 i (A) දිනය : 2017.05.16

1.2 අමාත්‍යාංශය : කාන්තා හා ළමා කටයුතු

යොමු අංකය : WCA/2/5/13/36/02 දිනය : 2017.07.11

1.3 කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් තනතුරු අනුමත කිරීම

යොමු අංකය : DMS/C/3/31/01 දිනය : 2017.10.11

1.4 ආයතන අධ්‍යක්ෂ ජනරාල්ගේ නිර්දේශය:

යොමු අංකය : EST-2/05/REC/12010 දිනය : 2018.03.08

1.5 ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ නිර්දේශය:

යොමු අංකය : NSCC/4/31/1/SR-1 දිනය : 2018.03.02

1.6 රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය:

යොමු අංක: PSC/EST/03-01-31/01/2018 දිනය: 2018.05.01

02. පත්කිරීමේ බලධරයා : රාජ්‍ය සේවා කොමිෂන් සභාව

03. සේවා ගණය පිළිබඳ විස්තර

3.1 සේවා ගණය : කළමනාකරණ සහකාර අධි පන්තිය

3.2 ශ්‍රේණි : විශේෂ

3.3 පැවරෙන කාර්ය භාරය පිළිබඳ පොදු නිර්වචනය : "අනුමත තනතුරු සංඛ්‍යාවට සීමා වන පරිදි අභ්‍යන්තර බඳවා ගැනීමේ ක්‍රියාවලියක් මගින් බඳවා ගනු ලබන, ජ්‍යෙෂ්ඨ විධායක හා විධායක නිලධාරීන්ගේ කාර්යභාරයට පරිපූරක/සුසාධ්‍යකාරක/උපස්ථම්භක වන පරිදි එම නිලධාරින්ගේ අධීක්ෂණයට යටත්ව තනතුරු විශේෂිත කොට පවරා දෙනු ලබන පරිපාලනමය/පිරිස් කළමනාකරණ සහ මූල්‍ය කළමනාකරණ කාර්යයන් පැවරෙන සේවා ගණයකි"

3.4 කාර්යයන් පැවරීම : "ශ්‍රේණිගතව කාර්යයන් පැවරීමක් සිදු නොකරන අතර,මෙම සේවා ගණයට පැවරෙන කාර්යයන් අතුරින් ඕනෑම කාර්යයක් සේවයේ අවශ්‍යතාව මත ජ්‍යෙෂ්ඨතාව හා කුසලතාව පදනම් කොටගෙන ඕනෑම ශ්‍රේණියක නිලධරයෙකුට දෙපාර්තමේන්තු ප්‍රධාන විසින් පවරනු ලැබිය හැක.

04 තනතුරෙහි /තනතුරුවල ස්වභාවය : ස්ථිර , විශ්‍රාම වැටුප් සහිත ( විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේ දී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයට යටත් විය යුතුය.)

05. වැටුප් :

5.1 වැටුප් කේත අංකය : MN - 07 - 2016

5.2 වැටුප් පරිමාණය : රු.41,580 – 11 X 755 – 18 X 1,030 – 68,425/-

5.3 ශ්‍රේණි ක්‍රමය හා ශ්‍රේණි ක්‍රමයට අදාළ මාසික වැටුප් පියවර:

| ශ්‍රේණිය | ආරම්භක වැටුප් පියවර | ආරම්භක වැටුප් තලය (රු.) |
|---|---|---|
| විශේෂ | පියවර 06 | 45,355/- |
| | | |

වර්ෂ 2016 සිට 2020 දක්වා වැටුප් ගෙවීම හා සෙසු කරුණු රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 03/2016 හි විධිවිධාන වලට අනුකූල විය යුතුය

06. සේවා ගණයට අයත් තනතුර / තනතුරු

6.1 අනුමත තනතුරු නාම, අනුමත තනතුරු සංඛ්‍යාව හා ඒවාට පැවරෙන කාර්යයන්

| අනුමත තනතුරු නාම | තනතුරු අනුමත ශ්‍රේණිය | අනුමත තනතුරු සංඛ්‍යාව | කාර්යයන් |
|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ පරිවාස නිලධාරී | විශේෂ ශ්‍රේණිය | 01 | ළමුන්ට අදාළ නීතිරීති, අණ පනත්, ප්‍රතිපත්තීන්, ප්‍රඥප්ති තුළින් පැවරී ඇති නියමයන් ඉටු කිරීම සම්බන්ධයෙන් II ශ්‍රේණියේ හා I ශ්‍රේණියේ පරිවාස නිලධාරීන්ගේ කාර්ය සාධනය වර්ධනය කිරීම සඳහා උපයෝගී වන්නා වූ කාර්යයන් ඉටු කිරීම, විධායක අධීක්ෂණ නිලධාරියා විසින් ළමා සංවර්ධනය සඳහා වූ අපේක්ෂිත අරමුණු ළඟා කර ගැනීමේ අපේක්ෂාවෙන් පවරනු ලබන කාර්යයන් ඉටු කිරීම. |

6.2 ඒකාබද්ධ නිලධර සංඛ්‍යාව : 01 කි.

07. බඳවා ගැනීමේ ක්‍රමය

7.1 බඳවා ගන්නා ප්‍රතිශතයන්

| ධාරාව | ප්‍රතිශතය |
|---|---|
| විවෘත | අදාල නොවේ |
| සීමිත | අදාල නොවේ |
| කුසලතා | 100% |

7.2 විවෘත බඳවා ගැනීම : අදාළ නොවේ

7.3 සීමිත බඳවා ගැනීම : අදාළ නොවේ

7.4 කුසලතා මත බඳවා ගැනීම

7.4.1 බඳවාගන්නා ශ්‍රේණිය : විශේෂ ශ්‍රේණිය

7.4.2 සුදුසුකම්:

7.4.2.1 අධ්‍යාපන සුදුසුකම් : අදාළ නොවේ.

7.4.2.2 වෘත්තිය සුදුසුකම් : අදාළ නොවේ.

7.4.2.3 පළපුරුද්ද :පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ පරිවාස නිලධාරී තනතුරක වසර පහළොව (15) ක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා ඉන් I ශ්‍රේණියේ වසර පහ (05)ක සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබිම

7.4.2.4 කායික සුදුසුකම් :සෑම අපේක්ෂකයෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත් තනතුරේ රාජකාරී ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

7.4.2.5 වෙනත් :

7.4.2.5.1 : අයදුම්කරුවන් විශිෂ්ඨ චරිතයකින් යුක්ත වීම

7.4.2.5.2 : උසස් කිරීමේ දිනට පූර්වාසන්නතම වසර පහ (05) තුළ සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම

7.4.2.5.3 : උසස්වීමේ දිනට පූර්වාසන්න වසර පහ (05) තුළ වැටුප් වර්ධක පහ (05) ක් උපයා ගෙන තිබීම

7.4.2.5.4 : තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය අනු අංක 7.4.2 සිට 7.4.2.5 දක්වා සුදුසුකම් අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් වන දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

7.4.3 වයස : අදාළ නොවේ

7.4.4 බඳවා ගැනීමේ ක්‍රමය : යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත බඳවා ගනු ලැබේ.

7.4.4.1 ලිඛිත විභාගය : අදාළ නොවේ

7.4.4.2 වෘත්තිය පරීක්ෂණය : අදාල නොවේ

7.4.4.3 සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය : යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයේදීම මූලික සුදුසුකම් පරීක්ෂා කරනු ලැබේ.

**7.4.4.4. යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය :**

ජ්‍යෙෂ්ඨ පරිවාස නිලධාරී තනතුරට බඳවා ගැනීම සඳහා වන යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය

| ලකුණු ලබාදෙනු ලබන ප්‍රධාන ශීර්ෂ | උපරිම ලකුණු ප්‍රමාණය | තෝරා ගැනීමට සලකා බලනු ලබන අවම ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| 1. ජ්‍යෙෂ්ඨතාවය | 60 | අදාළ නොවේ |
| 2. කුසලතාවය | 25 | |
| 3. වෘත්තීය සුදුසුකම් | 10 | |
| **4.** සම්මුඛ පරීක්ෂණයේ දී දක්වන කුසළතාවය | 05 | |
| 5. එකතුව | 100 | |

1. සුදුසුකම් ලැබූ අයදුම්කරුවන් අතුරින් යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයේ දී දක්වන ලද කුසලතා අනුපිළිවෙළ අනුව හා පවතින පුරප්පාඩු සංඛ්‍යාව අනුව තනතුරට බඳවා ගනු ලැබේ.
2. බඳවා ගැනීම සිදු කරන අවස්ථාවේදී ඉහත වගුවෙහි දැක්වෙන ලකුණු ලබා දෙන ප්‍රධාන ක්ෂේත්‍ර සඳහා වෙන් කර ඇති උපරිම ලකුණු ප්‍රමාණයන් ඇතුළත, යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය සඳහා විස්තරාත්මක ලකුණු පරිපාටිය අනුමත කිරීම පත් කිරීම් බලධරයා විසින් සිදු කරනු ලැබේ.
3. විස්තරාත්මක ලකුණු පරිපාටිය අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ ප්‍රසිද්ධ කළ යුතු වේ.

**7.4.4.4.1 යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය පත් කරනු ලබන බලධරයා:** රාජ්‍ය සේවා කොමිෂන් සභාව

**7.4.5 අයදුම්පත් කැඳවීමේ ක්‍රමය** :මධ්‍යම රජයේ පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව තුළ අභ්‍යන්තර නිවේදනයක් මඟින්

**08. කාර්යක්ෂමතා කඩඉම** : අදාළ නොවේ

**09. භාෂා ප්‍රවීණතාව** : අදාළ නොවේ

**10. ශ්‍රේණි උසස් කිරීම්** : අදාළ නොවේ

**11. තනතුරුවලට පත් කිරීම** : අදාළනොවේ

**12. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පරිපාටික රීතිවල දැක්වෙන පොදු කොන්දේසිවලට පරිබාහිර වන්නා වූ කොන්දේසි** : අදාළ නොවේ